



# මතක සුළඟ ගෙන එන ආචාර්ය මහේෂ් බණ්ඩාර

සිවිකාව සඳහා ක්ෂුද්‍ර ජීවී ආසාදන වැලැක්වීම පිළිබඳ පර්යේෂණ පවත්වන අතර ඒ පිළිබඳ ව පේටන්ට් බලපත්‍රයක් ද අයදුම් කර තිබෙන ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ ආචාර්ය මහේෂ් බණ්ඩාර





**ඕස්ට්‍රේලියාවෙන් ශ්‍රී ලාංකිකයිනට තිළිණ කරන තවත් ටෙලි වෘත්තාන්තයක් තමයි "මතක සුළඟ". මෙවැනි නිර්මාණයන් කරන්නට, අධීක්ෂණයට කෙසේද ඔබ යොමුවන්නේ**

ඇත්තටම මෙය සත්‍ය සිදුවීමක් පාදක කරගෙන කරපු නිර්මාණයක්. පරම්පරා ඝට්ටනය හා ඇබොරිජිනල් ජාතිකයෙකුට දාව උපදින දරුවෙකු පිළිබඳවයි මේ ටෙලි වෘත්තාන්තයේ දිග හැරෙන්නේ. ලංකාවේ සිට විදේශයක ටෙලි නාට්‍යයක රඟපෑමට එකතුවන ප්‍රවීනයන් විශාල පිරිසක් සම්බන්ධ වෙනවා. මේක මගේ කුළුඳුල් ටෙලි නාට්‍යය දැනුම උරගා බැලීමක්. කලකට පෙර අර්නස්ට් පෝරුතොට පියතුමා ගේ අධීක්ෂණය යටතේ පැවති ඕ.සී.අයි.සී සිනමා පාඨමාලාව හදාරන්නට මට හැකියාව ලැබුනා. ඒ ලැබුන ප්‍රායෝගික දැනුම අතරේ නිශ්චල ඡායාරූප ගැනීම, වීඩියෝ කරණයටද යොමුවුනා.

1990 දී විතර තමා වීඩියෝ කැමරාවකට ඇහැ තිබ්බේ. මේ අතර තුරේ නවසීලන්තයට ද ගොස් යම් යම් කැමරාකරණය පිළබඳ අත්හදා බැලීම් කටයුතු කලා. "මතක සුළඟ" තිර නාටකය ලිව්වේ නම් 2005 දී නමුත් රැකියාවේ කාර්ය බහුලත්වය නිසා විටින් විට කල්ගියා. මෙය සම්පූර්ණ කරගන්නට කේ.බී.හෙරත් මහතා ගේ උපදෙස් ලොකු උපකාරයක් වුනා. 2010 දී තමා රූ ගත කිරීම් ආරම්භ කලේ. දැන් අපි කාලය එනතුරා ඉන්නේ ජාතික රූපවාහිනී නාලිකාවෙන් රාත්‍රී 8.30 දර්ශණ පටය පෙන්වීමේ අරමුණ උඩ. වෙලාව වෙන්කර ගැනීමත් ලේසි පහසු දෙයක් නොවෙයි නේ..ඉතින් අපිත් ඉන්නවා අනෙක් අය වාගේ වාරය එනතුරු.

**මේ රූ ගත කිරීම් අතරතුර ඔබ මුහුණ දුන් අසීරුතාවන් ද ඇති**

ශ්‍රී ලාංකාවේ රූ ගත කිරීම් කරනවාට වඩා විදේශයක කරනාවිට කොහොමත් සෑහෙන කැපවීම් කරන්නට වෙනවා-නේ. එකක් පිරිස් බලයේ අඩුකම. අතිධාවනකාරී කාලයකට ජීවන රටාවන් හැඩ ගැහෙන මේ වාගේ රටක රැකියාවට නොගොස් මේ වෙනුවෙන් ම කැපවෙන්නට කාලය අඩුයි. නැත්නම් බොහෝ දෙනාගේ සහයෝගය නො අඩුව ලැබෙනවා.

ඒ උනත් මේ ටෙලි නාට්‍යයට සම්බන්ධ වූ ප්‍රවීනයන් ම බොහෝවිට ඔවුනගේ උපරිම සහාය ලබාදුන්නා. වසන්ත විට්ටච්චි, ශ්‍රියන්ත මෙන්ඩිස්, කුසුම් රේණු, ගීතා කාන්ති ජයකොඩි, ලක්ෂ්මන් විජේසේකර දර්ශණ තලයේ දී දුන් සහයෝගය ඉතා අගය කරනවා. ලක්ෂ්මන් විජේසේකර අවු 15 කට පසුව තමා රඟපෑමට ආයෙත් එකතු වෙන්නේ "මතක සුළඟ" ටෙලි නාට්‍යයට.

**ඔබ තවත් නිර්මාණයකට අත තබන්නට යන බව ආරංචියි.**

ඒක මට හිතෙන්නේ විශාල වූ කටයුත්තක් අපි ජාත්‍යාන්තරයට ගෙන යාමේ අරමුණ උඩ නිර්මාණ කලයුතු යුගයක් මේක. මේ දිනවල තිර පිටපත ලියාගෙන යනවා. එන අවුරුද්දේ අග වෙනකොට රූ ගත කිරීම් කරන්නයි බලාපොරොත්තුව. බටහිර ඕස්ට්‍රේලියාවේ තමා රූ ගත කිරීම් වැඩි හරියක් කෙරෙන්නේ. සෑහෙන වියදමක් දරන්නට වෙන එක තමා කියන්නට තියෙන්නේ. මේක අපට විතරක් නොවෙයි ඕස්ට්‍රේලියානු නරඹන්නන්ට ද යම් කිසි වැදගත් කමක් ගෙන දෙන්නට පුළුවන්. ශ්‍රී ලාංකිකයින් හා ඕස්ට්‍රේලියානුවන් රඟපෑමෙන් හා කාර්මික කරණයෙන් දායක වෙනවා.

**වෘත්තීය කාර්ය බහුලතා මාධ්‍යයේ ඔබ සිංහල ප්‍රජාවට යම් සේවයක් කරනවා**

නැතුව බෑනේ...මම කාලෙක ඉඳලා සිඩ්නි නුවර ස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ වැඩ කටයුතු වලට සහාය දුන්නා. විධායක කමිටුවල, හා සභාපති තනතුරේ ද කටයුතු කලා. මෙහේ සිදුවෙන බොහෝ ප්‍රාසාංගික කටයුතු වලට අතහිත දෙනවා. මොන කාර්ය බහුලතා තිබනත් එක් රැස් වෙලා යමක් කරනකොට සති අන්තයේදී මහන්සි ටිකක් නැතිවෙලා යනවා. මා විතරක් නොවෙයි අපේ මේ සිංහල ප්‍රජාව හන් අයුරින් සහභාගී වෙනවා අවැසි වෙලාවට. ඒකාකාරී රටාවෙන් මිදීම තමා ලොකුම දේ.

**මම තව දශක දෙක තුනක් ආපස්සට යනවා. ඔබ නේද තර්ස්ටන් විදුහලේ ඉඳන් චිත්‍රකතා පත්තර වලට කාටූන් සපයපු සිසුවා. මට ඔබ හොඳ හැටි මතකයි. මාත් ඔය කාලෙදි ඔබ කල දේ ම කලා.**

මතකය අමතක නොවන කාලයක්...ඩී.එස්.සේනානායක විදුහලේ සංජය විතාන...ඔහු දැන් චිත්‍රපට හා ටෙලි නාට්‍ය අධ්‍යක්ෂකවරයෙක්, මහින්ද මිරිහාගල්ල, වර්නන් තිසේරා, පියල් උදය, ඔබ සමකාලීනව පත්තර වලට කුරුටු ගෑ කට්ටිය. ඒ කරපු දේවල් තාමත් මතකයි. ඉඳහිට වෙලාවක් ලැබුනා ම යමක් අඳින්න බලනවා. මගේ වැඩි අවධානය චිත්‍රපට, ටෙලි නාට්‍යයන් නිර්මාණය කරන්නට තමයි.







කල්දෙමුල්ල